සිය පෑන් තුඩින් එතෙර මෙතෙර දස්කම් පාන නිහඬ ලේඛිකාව

ස්වර්ණකාන්ති රාජපක්ෂ

සම්මානිත මහාචාර්ය,
කුසුමා කරුණාරත්න
මෙල්බර්න් නගරයේදී

ප්‍රතිභාව, වියුත්පත්තිය හා සතත අභ්‍යාසය ඕනෑම කලාකරුවකු අතින් බිහි වන විශිෂ්ඨ නිර්මාණවලට පාදක වන කරුණු තුනක් වෙයි. ප්‍රතිභාව වූ කලි ලේඛකයකු හෝ ලේඛිකාවක් සහජයෙන්ම ලබන කුසලතාවකි. උම්මග්ග ජාතකයෙහි කියවෙන පරිදි මහොෂධ පඬිතුමා මව්කුසින් බිහි වූයේ සඳුන් ගැටයක් අතැතිවය. දක්ෂ නිර්මාණ කරුවා ද උපතේ සිටම සිය ප්‍රතිභාව රැගෙන එයි. එම දක්ෂතාව හුදෙක් බීජයකින් හටගන්නා පැලයකට සමාන කළහොත් ඊට ලැබෙන සාරවත් පස, ජලය හා පොහොර මෙන්ම සාත්තුව ද සමග මුවහත් වී, දියුණු තියුණු වී, විශිෂ්ට නිර්මාණ ලෙස මල්පල ගැන්වෙයි. බාල වියේ සිටම කෙනකු දක්වන සහජ කුසලතාව වැඩි වර්ධනය වී අවුත් දක්ෂ ලේඛක ලේඛිකාවන් බිහි වන්නේ ද ඒ අයුරිනි. එසේ බිහි වන ලේඛක ලේඛිකාවන් අතුරෙන් අදතමුත් තම කුසලතා මතු කර දක්වමින් සෙස්සන්ගේ ඇගයීමට පාත්‍ර වන අතර තවත් ඇතැම්හු නිර්මාණ ඉදිරිපත් කරමින්, ඒවාට ලැබෙන ප්‍රතිචාර දෙස නිහඬවම බලා සිටිති.

ඕ ෂිංජෙං ගේ THE SOUL MOUNTAIN නම් නවකතාව, එයින් මතු වන ජීවය මෙන්ම සුන්දරත්වය ද නොනසා, මනරම්' කෙලෙසකින් සිංහලයට හගන්නට මෙම ලේඛිකාව සමත් වූ බව 2010 වසරේ පළ වූ දිව්ගිර පරිවර්තන නවකතාව මගින් පාඨකයාට දැකගන්නට හැකි විය. මෙම නවකතාවේ අන්තර්ගත කදිම වාතාන්තය යටින් දිවෙන සුන්දර අත්දැකීම් ගා ඕ ෂිංජෙං නැමැති චීන නවකතා කරුවා දුටු අයුරින්ම සිය පරිවර්තනයෙන් සිංහල පාඨකයා වෙතට ගෙන ඒමට කතුවරිය දැරූ ප්‍රයත්නය සැබැවින්ම අගය කළ යුතු වෙයි. මෙය 2011 වසරේ රාජ්‍ය සාහිත්‍ය සම්මාන සඳහා නිර්දේශ වීම ද විශේෂත්වයකි.

ස්වර්ණකාන්ති අතින් පරිවර්තනයෙන් එළි දුටු අනික් සාහිත්‍ය කෘති සංඛ්‍යාවද සැලකිය යුතු තරමිය. ඒ අතරෙන් සුප්‍රකට ඇමෙරිකානු ලේඛක ජෝන් ස්ටයින්බෙක් විසින් රචිත TO A GOD UNKNON නම් කෘතිය 'රැක් දෙවියෝ' නමින් ද යැන් මාටෙල්ගේ Life of Pi යන්න, 'මගේ නම පයිසින් මොලිවර් පටෙල්' නමින් ද පරිවර්තනය වූ කෘති වැදගත් වෙයි.

පරිවර්තන කාර්යයේදී හුදෙක් භාෂා ඥානය පමණක්ම ප්‍රමාණවත් නොවනු ඇත. "She put it right behind the table" වැනි යෙදුමක් සිංහලයට නැගීමේදී "ඇය මේසය පිටුපස දකුණු පසින් එය තැබුවාය" යනුවෙන් පරිවර්තනය කරන්නට යොමු වන ලේඛකයෙක් හෝ ලේඛිකාවක් අඩු වශයෙන් අදාළ භාෂා දෙක වත් හරිහැටි නොදැනීමෙන් සිදුවන වැරදි කොතෙකුත් ඇත.

මෙගිදී මාගේ සඳහනට ලක් වන්නේ මේ අතුරෙන් දෙවැනි ගණයේ ලේඛිකාවකි. දශක කිහිපයක් තිස්සේ සිංහල හා ඉංග්‍රීසි භාෂා ද්වයෙන්ම ස්වීය ගද්‍ය හා ගී පද නිර්මාණ මෙන්ම සාහිත්‍ය කෘති හා වෙනත් විෂයයන් අළලා ලියවුණ කෘතීන් රැසක් පරිවර්තනයෙන් ද එළිදක්වමින් විශිෂ්ට මෙහෙවරක් ඉටු කළ හා තවදුරටත් ඉටු කරමින් සිටින ස්වර්ණකාන්ති රාජපක්ෂ ශ්‍රී ලංකාවේදී මෙන්ම දැනට වාසය කරන මෙල්බර්න් නගරයේදී ද අඛණ්ඩව, සිය මෙහෙවරෙහි යෙදී සිටින්නීය.

වසර 1972 දී කැලණිය විශ්වවිද්‍යාලයෙන් ශාස්ත්‍රවේදී උපාධියක් ලද ඇය අනතරුව විවිධ ක්ෂේත්‍රයන්හි අගනා සමාජ මෙහෙවරක් ද ඉටු කරමින් සාහිත්‍ය හා ශාස්ත්‍රීය සේවයක නිරත වූවාය. සිය උපාධි පරීක්ෂණවලට නියමිතව තිබූ විශ්වසාහිත්‍ය කෘති අතර, රුසියානු සාහිත්‍යයේ මුදුන් මලකඩක් බඳු ඇනා කරේනිනා නවකතාවේ ඉංග්‍රීසි පරිවර්තනය කිහිප වතාවක්ම රස විඳිමින් කියවූවාය. අසම්මත පෙම් බැඳුමකින් ලද සතුට සමගම එය පිටුපස ආ නිරන්තර දොම්නස හා කලකිරීම ද විඳිමින් සිටි ඇනාගේ රූපකාය සහ වේදනාකාරී හැඟීම් සවර්ණකාන්තිගේ මනස වදුම් දෙවමින් යළි යළිත් සිහිපත් විය.

ටෝල්ස්ටෝයිගේ ඇනා කැරනිනා නවකතාව එවකට සිංහල පාඨකයන් හඳුනාගෙන සිටියේ ප්‍රවීණ ලේඛක හා පරිවර්තක මුනිදාස සෙනරත් යාපා විසින් සංක්ෂේපයෙන් ඉදිරිපත් කරන ලද සිංහල පරිවර්තනයෙනි. ඔහු සිය භාෂා ප්‍රාගුණ්‍යය මැනවින් මෙහෙයවමින් විදග්ධ භාෂා ශෛලියකින්, එහෙත් සැකෙවින්, එම පරිවර්තනය කර තිබුණ අතර, මුල් කෘතියෙන් ඉංග්‍රීසි බසට සම්පූර්ණයෙන්ම පරිවර්තනය වී ඇනා කරේනිනා නවකතාව, ස්වර්ණකාන්තිගේ මනහර සරල බසින් සිංහලයට නැගී පාඨකයන් අතට පත් වූයේ වසර 2007 දීය. රාජ්‍ය සාහිත්‍යය සම්මානයෙන් පිදුම් ලද මෙම පරිවර්තන කෘතියේ පිටපත් ශිෂ්‍යයෙන් අලෙවි වී තිබීමම එහි සාර්ථකත්වයට සාක්ෂි දරන බව අමුතුවෙන් නොකිවමනාය. විශ්වවිද්‍යාලවල ඇතැම් පාඨමාලා සඳහා ද නිර්දේශිත කෘතියක් ලෙසට මෙය භාවිතා කරනු ලැබීය.

රුසියානු සාහිත්‍යයෙන් ඔබ්බට යමින් ස්වර්ණකාන්ති අතින් පරිවර්තනය වූ වෙනත් ග්‍රන්ථ රාශියකි. ඒ අතර, කුරුල්ලා සහ තරු මඬල නම් පරිවර්තන කෙටිකතා සංග්‍රහය ද, රාජ්‍ය සාහිත්‍ය සම්මානයෙන් පිදුම් ලද තවත් කෘතියකි. සිංහල පාඨකයන් සඳහා පරිවර්තනයට සුදුසු, අනගා විදේශීය සාහිත්‍ය කෘති තෝරාගැනීමට ස්වර්ණකාන්ති තුළ ඇත්තේ විශිෂ්ට දක්ෂතාවකි. ලෝක ප්‍රකට සාහිත්‍ය කෘතියක් වන ගා පරිවර්තනයේදී එක් බසකින් තවත් බසකට පරිවර්තනය කරන අතරම එක් සංස්කෘතියකින් තවත් සංස්කෘතියකට යෝග්‍ය පරිදි පරිවර්තනය වීමක් ද අවශ්‍ය වනු ඇත. ඒ අතින් සිදු වන අඩුපාඩු අතර අර්නස්ට් හෙමිංවේ නම් වූ සුප්‍රකට ඇමෙරිකානු නවකතා කරුවාගේ Ten Indians නම් කෘතියේ අන්තර්ගත යෙදුමක් වන, "Indians are killing snakes tonight" යන්න "අද රෑට ඉන්දියානුවෝ නයි මරති" යනුවෙන් සාවද්‍ය ලෙස කරන ලද පරිවර්තනයක් ගැන මා හට සිහිපත් වෙයි. "Killing Snakes" යන යෙදුම හෙමිවේගේ නිර්මාණ බිහි වූ අවදියේදී, එම සංස්කෘතිය තුළ ව්‍යවහාර වූයේ (රූඪ) ඉන්දියානුවන් බීමත් වී (වෙරි වී) සිටීම යන අරුත දැනවීම විනා මෙහි වචනාර්ථයෙන් කියවෙන පරිදි 'නයි මැරීමක්' ගැන සඳහන් කිරීමට නොවේ. මෙලෙසින් බලන විට සාහිත්‍ය කෘති පරිවර්තනයේදී භාෂා ඥානයට අමතරව අදාළ සංස්කෘතීන් පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් හා අවබෝධයක් ද අවශ්‍ය වන බව කිව යුතුය. ස්වර්ණකාන්ති, පරිවර්තන කාර්යයේදී මෙම කරුණු ගැන විශේෂ අවධානය යොමු කරන ලේඛිකාවකි.

ස්වර්ණකාන්ති බොහෝ සාහිත්‍ය පොතපත හැදෑරීම මෙන්ම දීර්ඝකාලීන පරිවාසයින් ද යුත් ලේඛිකාවක් වන බව ඇය අතින් මෙතෙක් පළ වී ඇති කෘති අපට පේනවා දෙයි. Trumen Capote විසින් රචිත IN COLD BLOOD නම් වූ ප්‍රකට නවකතාව මෙම කතුවරිය අතින් ප්‍රකාශයට පත් වූ අගනා පරිවර්තනයකි. දේශපාලනය, සමාජය, ජීවිතය හා මනුෂ්‍ය සම්බන්ධතා පිළිබඳ පුළුල් අවබෝධයකින් යුත් මෙම ලේඛිකාවට පරිවර්තනය සඳහා අතට ගන්නා කවර කෘතියක් වුව නිම කිරීමට ගත් වෙන්නේ ඉතා කෙටි කාලයකි.

එක් කෘතියක පරිවර්තනයක් නිමවා ඉසුඹු ලන්නට නොනවතින ඇය අතට තවත් පොත් ප්‍රකාශකයකු හෝ වෙනත් කෙනකු තවත් පොතක් පත් කරන්නේ එම කාර්යයෙහිලා ඇය තුළ ඇති දක්ෂතාව පමණක් නොව උනන්දුව හා කැපවීම ද ඔවුන් දන්නා හෙයිනි.

ඇමරිකානු ජාතික මහාචාර්යවරියක වන මහාචාර්ය මිෂෙල් ගැම්බර්ඩ් ශ්‍රී ලංකාවේ ගැම් පෙදෙසක් සිය දර්ශන විශාරද උපාධිය සඳහා අවශ්‍ය පර්යේෂණ කටයුතුවලට පාදක කරගන්නාය. එහි ප්‍රතිඵල වශයෙන් ප්‍රකාශයට පත් වූ Kitchen Spoon Handle නම් වූ ශාස්ත්‍රීය ග්‍රන්ථය ස්වර්ණකාන්ති අතින් පරිවර්තනය වී ප්‍රකාශයට පත් වූයේ " හැඳි මිටේ නුවණ - ශ්‍රී ලංකාවේ විගමනික ගෘහ සේවිකාවෝ" යන නමිනි. රැකියා සඳහා මැද පෙරදිගට යන ශ්‍රී ලාංකික කාන්තාවන් පිළිබඳ විවිධ තොරතුරු ගැඹුරු ශාස්ත්‍රීය පර්යේෂණයකට ලක් කෙරෙන මෙම කෘතිය ශ්‍රී ලාංකික පාඨකයින්ට හා විශේෂයෙන්ම අදාළ පර්යේෂණයන්හි නිරත වන විද්‍යාර්ථීන්ට ද මහඟු ප්‍රයෝජන සලසන්නකි. "The Illicit Liquor Culture in Sri Lanka" නම් වූ කෘතිය මෙම ලේඛිකාව විසින් "ශ්‍රී ලංකාවේ නීතිවිරෝධී මත්පැන් සංස්කෘතිය" යන නමින් පරිවර්තනය කරනු ලැබ ප්‍රකාශයට පත් වී ඇත.

ස්වර්ණකාන්ති සිය පෑන් තුඩ මෙහෙයවන්නේ සාහිත්‍ය නිර්මාණ පරිවර්තනයට පමණක් නොවේ. අගනා ශාස්ත්‍රීය කෘතීන් ඉංග්‍රීසි බසින් සිංහලයට පෙරළා ප්‍රකාශයට පත් කිරීමට ද ඇට සිය වටිනා කාලය වැය කරන්නේ ඉංග්‍රීසි බසින් පොත පත කියවීමට යොමු නොවන ශ්‍රී ලාංකික පාඨකයන් ගැන විශේෂ උනන්දුවක් දක්වමිනි. ඇයගේ නිර්මාණ, ශාස්ත්‍රීය කෘති පරිවර්තන ආදියට අමතරව පළ වී ඇති ස්වාධීන නිර්මාණ ද විශේෂයෙන් සඳහන් කළ යුතු වෙයි. මෑතකදී ඇය අතින් රචනා වී ප්‍රකාශයට පත් වූ 'දවුල' නම් නව කතාව මීට හොඳ නිදසුනකි. 'දවුල' නවකතාව, ශ්‍රී ලංකාවේ වෙසෙන සමාජ කොට්ඨාසයක් කෙරෙහි අවධානය යොමු කරමින් ඉතා අනුවේදනීය සිදුවීම් අන්තර්ගත කොට රචිත කෘතියකි. දැඩි පාඨක ප්‍රසාදයට ලක් වූ මෙම නවකතාව මනාව සැකසුණ පිට කවරයකින් ද යුක්තය.

මේ අයුරින් ශාස්ත්‍රීය හා සාහිත්‍ය කෘති පරිවර්තනයෙහිලා විශේෂ හැකියාවකින් යුත් මෙම කතුවරිය අතින් නිමවූ තවත් රසවත් ස්වීය කෙටිකතා සංග්‍රහයක් ලෙස 'නිල් දැල්ල මෝරලා' නම් කෘතිය හැඳින්විය හැකිය. ස්වාධීන හා පරිවර්තන කෘති දිගින් දිගටම ඇය අතින් ප්‍රකාශයට පත් වෙද්දී සිංහලයෙන් ඉංග්‍රීසියට නැගුණ තවත් කෘතියක් නම්, (GONE WITH THE WAVE" නම් කෙටිකතා සංග්‍රහයයි. ශ්‍රී ලංකාව ඇතුළු වෙනත් රටවල් කිහිපයක්ම මුහුණ දුන් සුනාමි ඛේදවාචකය පාදක කරගනිමින් රචිත 'පුංචි කැරේ වතුරෙ ගිහින්' (TSUNAMI) නම් කෙටි කතා සංග්‍රහය (Gone With The Wave) නමින් ඇය අතින් ඉංග්‍රීසියට නැගෙද්දේ (TSUNAMI) නමින් ජපන් බසටත් "ස්නසැස්සැ බසටත් පරිවර්තනය වූ කෙටිකතා සංග්‍රහයකි.

ගීත රචනය අතින් මෙම ලේඛිකාව දක්වා ඇති හපන්කම් බොහෝමයකි. ඒ හැරුණු විට ශ්‍රී ලංකාවේ විශිෂ්ට ගායක ගායිකාවන් විසින් ගයන ලද ගීත සියයක් ඇය ඉංග්‍රීසියට පරිවර්තනය කොට 'LYRICS OF LANKAZ නමින් පළ කර ඇත. ලේක් හවුස් ආයතනයේ අනුග්‍රහයෙන් ප්‍රකාශයට පත් වූ මෙම කෘතිය ශ්‍රී ලාංකික මන්ම විදේශීය රසිකයන්ගේ ද අවධානයට ලක් වූවකි. විවිධ වූ නිර්මාණ හා ශාස්ත්‍රීය කෘතීන් සිංහලයට හා ඉංග්‍රීසි බසට පරිවර්තනය කරන්නට ආරාධනා ඇය වෙත ගලා එන්නේ ඇය සතු මෙම කුසලතා හා ඇය කෙරෙහි ප්‍රකාශයන් අතර ගොඩනැගී දැඩි විශ්වාසය ද නිසාය. එපමණක් නොව, වෛද්‍ය විද්‍යාව, මනෝවිද්‍යාව ආදී ගැඹුරු විෂයයන්ට අදාළ කෘතීන් වුවද එවන් ආරාධනා මගින් ඇය අතින් පරිවර්තනය වන්නේ ඊට අවශ්‍ය නිවැරදි පාරිභාෂික යෙදුම් ආදිය ද සුපරීක්ෂා කාරී ලෙස සෙයා බලා එම කටයුත්ත ඇය අතින් ඉටු වන බව දන්නා හෙයිනි.

සිය නිර්මාණ, ඇගයීමට ලක් වුවා හෝ නොවුවා හෝ, සම්මානයට පාත්‍ර වුවා හෝ නොවුවා හෝ ඇය සම සිතින් ඒ ගැන සිතා සතුටට පත් වන බව අප දැනිමු. සූපයෙහි රසය හැන්ද නොහඳුනතත්, එය ආහාරයට ගන්නා තැනැත්තියගේ දිව එම රසය හොඳින් හඳුනන බව නියත වශයෙන්ම අවබෝධ කරගෙන සිටින මෙම ලේඛිකාව නිහඬවම, සිය පෑන් තුඩින් නොනවත්වාම රචනය කරන අනේකවිධ පරිවර්තන හා ස්වීය ග්‍රන්ථ සහෘදයන්ගේ සිත් ගන්නා බව පිළිබඳව දැඩි විශ්වාසයකින් හා අවබෝධයකින් පසුවන්නීය.

මෙලෙසින්, ස්වර්ණකාන්ති නම් වූ මෙම ලේඛිකාව, එතෙර මෙතෙර සිට නිහඬවම සිය නිර්මාණ කටයුතු අඛණ්ඩවම කරගෙන යද්දී, එම කටයුතු සහෘදයන්ගේ රස ජනනය හා දැනුම වර්ධනය සඳහා තව තවත් ඉදිරියට කරගෙන යන්නට ඇයට ශක්තිය හා ධෛර්යය ලැබේවායි අපි ඉත සිතින් ප්‍රාර්ථනා කරමු.